# සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව

## சிறைக்கைதிகளின் உரிமைகளை பாதுகாக்கும் குழு

## COMMITTEE FOR PROTECTING RIGHTS OF PRISONERS

2020.03.16

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති තුමා,

ජනාධිපති ලේකම් කාර්යාලය,

කොළඹ 01.

ගරු ජනාධිපති තුමණි,

**බන්ධනාගාර තුල කොරෝනා වෛරස අභියෝගය ජය ගැනීමට මැදිහත් වන ලෙස ඉල්ලීම**

මේ වන විට ගෝලීය වසංගතයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති කොරෝනා වෛරසයේ බලපෑමට ශ්‍රී ලංකාවද හසුව ඇත. මෙම රෝගයේ ව්‍යාප්තිය පාලනය කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග විශේෂඥයන් විසින් යෝජනා කර ඇතත්, බන්ධනාගාර තුල පවතින්නේ මෙම රෝගය හොඳින් පැතිරිය හැකි වටපිටාවකි.බන්ධනාගාර තුල පවතින අධික තදබදය ඉන් ප්‍රධාන සාධකයක් වශයෙන් ඔබ තුමාට දන්වනු කැමැත්තෙමි.

කොළඹ, වැලිකඩ බන්ධනාගාරය සිර කරුවන් 800 පමණ රඳවා තැබීමට ආරම්භ කර ඇතත්, මේ වන විට එහි රැඳවියන් 5000 කට ආසන්න ප්‍රමාණයක් රඳවා ඇත. එසේම බන්ධනාගාර රෝහලද පවතින්නේ අඩු පහසුකම් මධ්‍යයේය. මේ තත්වය තුල කොරෝනා රෝග ව්‍යාප්තිය සිදුවුවහොත් එය එහි රඳවා සිටින රැඳවියන්ට පමණක් නොව බන්ධනාගාර කාර්ය මණ්ඩලයටද එමගින් මාරාන්තික තත්වයන් ඇතිවීමේ හැකියාව පවතී.ඒ තුලින් රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු වලටද විශාල බලපෑමක් සිදුවීමට ඉඩ ඇත. දැනටමත් අනුරාධපුර බන්ධනාගාරයේ රඳවා සිටි විදෙස් ජාතික රැඳවියෙක් කොරෝනා රෝග ලක්ෂණ මත අයි.ඩී.එච්.රෝහලට ඇතුලත් කොට තිබේ.

ඒ අනුව අප සංවිධානය විසින් බන්ධනාගාර තුල පවතින තදබදය ඉවත්කර කොරෝනා අභියෝගය ජය ගැනීම සඳහා පහත යෝජනා ඉදිරිපත් කර සිටිමු.

1. බන්ධනාගාර ආඥා පනතේ ප්‍රතිපාදන පරිදි සිවිවස් සමාලෝචනය ඇතුළු සමාලෝචන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ එමගින් දැනටමත් සුදුසුකම් ලැබූ රැඳවියන් නිදහස් කිරීම
2. බන්ධනාගාර ආඥාපනතේ ප්‍රතිපාදන ප්‍රකාර සුදුසුකම් ලැබූ සියලු රැඳවියන්ට නිවාස නිවාඩු ලබා දීම
3. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 34 වෙනි ව්‍යවස්ථාවෙන් ඔබතුමාට පැවරී ඇති බලය ප්‍රකාරව කටයුතු කරමින්, සුළු දඩුවම් ලැබූ රැඳවියන්, සුළු දඩ මුදල් ගෙවා ගැනීමට නොහැකි රැඳවියන්, බරපතල ලෙස රෝගාතුර වූ රැඳවියන් සහ අවුරුදු 70 ඉක්මවා ගිය වයෝවෘධ රැඳවියන් නිදහස් කිරීම.

එසේම ජාත්‍යන්තර වශයෙන් ඉරානය,කොරියාව, සහ ඉතාලිය විසින් බන්ධනාගාර තුල කොරෝනා රෝග ව්‍යාප්තිය පාලනය සඳහා මේ වන විටත් සුදුසු රැඳවියන් නිදහස් කරමින් ගෙන යන වැඩ පිළිවෙල සිහිපත් කරමින්, ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ රැඳවියන්ගේත්, බන්ධනාගාර කාර්ය මණ්ඩල වලත් ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙන් අප විසින් ඉදිරිපත් කර ඇති ඉහත යෝජනා සියල්ලම හෝ කිහිපයක් ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කර බන්ධනාගාර තුල කොරෝනා අභියෝගය ජය ගැනීමට මැදිහත් වන ලෙසයි.

මෙයට,

නිහිඳු සේනක පෙරේරා
සභාපති

Committee for Protecting Rights of Prisoners
No,188,Hulftsdorp Street,
Colombo 12.
Reg. No. 00211612

සුදේශ් නන්දිමාල් සිල්වා
ලේකම්

පිටපත්:- 1. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා, බන්ධනාගාර පිළිබඳ අමාත්‍ය
2. බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්,බන්ධනාගාර මූලස්ථානය,කොළඹ.